# රබර් වගාවේ මෑත කාලීන ප්‍රවණතා

කේ.ඒ.එස්.ආර්. කුලසිංහ[1]

## සංක්ෂේපය

ශ්‍රී ලංකාව තුළ අපනයන ප්‍රමුඛ කෘෂිකාර්මික බෝග අතරින් රබර් වගාවට ප්‍රධාන තැනක් හිමිවේ. අද වන විට රබර් වගාව දෙස අවධානය යොමු කිරීමේදී පැහැදිලි වන්නේ රබර් නිෂ්පාදනය අඛණ්ඩව පහළ යෑමේ ගැටලුවට මුහුණ දී ඇති බවයි. මෙම තත්වය මඟහරවා ගනිමින් රබර් නිෂ්පාදනයේ වර්ධනය පිළිබඳ අධ්‍යනය කිරීම මෙහි අරමුණ වී ඇත. ඒ අනුව 2014 වාර්ෂික මහ බැංකු වාර්තාව, 2007-2013 දක්වා ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන වාර්තා මූලාශ කොට ගනිමින් ද්විතියික දත්ත මගින් කාල ශ්‍රේණි වැනි විශ්ලේෂණ ක්‍රමවේදයන් ඔස්සේ දත්ත විශ්ලේෂණය කොට ඇත. රබර් වගාව සඳහා එල්ල වී ඇති තර්ජන අතරින් ඒ සඳහා යොදා ගැනෙන භූමි ප්‍රමාණය පහළ යෑම, ශ්‍රම හිඟය බලපාන අතරම ජාත්‍යන්තර වෙළෙඳපොලේ පවතින දැඩි තරඟකාරිත්වය, කාර්මික රටවල් කෘත්‍රිම රබර් නිෂ්පාදනයට යොමු වීම, ප්‍රතිචක්‍රීකරණය තුළින් නැවත නැවතත් රබර් භාවිතයට යොමුවීම ප්‍රධාන වේ. මෙවැනි තත්වයන් හේතු කොටගෙන රබර් වගාකරුවා වෙනත් වගාවන් කෙරෙහි නැඹුරු වී ඇත. එම තත්වය මඟහරවා ගැනීම සඳහා රජය විසින් විවිධ ක්‍රියා මාර්ග ගෙන ඇති අතර එහිදී සාම්ප්‍රදායික රබර් වගා ප්‍රදේශවලින් ඔබ්බට අම්පාර, මුලතිව්, වව්නියාව වැනි ප්‍රදේශ දක්වා ද රබර් වගාව ව්‍යාප්ත කෙරිණි. එමෙන්ම රබර් වගාව සඳහා පොහොර සහනාධාර ලබා දීම, නව වගාවන් හා නැවත වගාවන් සඳහා සහනාධාර ක්‍රම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම ද ආයෝජන ප්‍රවර්ධන කලාප පිහිටුවීම, අපනයන නිෂ්පාදන ගම්මාන පිහිටුවීම, විදේශ රටවල් සමඟ වෙළෙඳ ගිවිසුම්වලට එලඹීම වැනි ක්‍රියාමාර්ග රජය විසින් ගෙන ඇත. තවදුරටත් ශ්‍රී ලාංකික රබර් අපනයනය ඉහළ මට්ටමක පවත්වා ගනිමින් මෙරට තුළ රබර් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග කිහිපයක් හඳුනාගත හැකිය. රබර් වගා භූමි වෙනත් වගා සඳහා යොදාගැනීම පාලනය සඳහා නීති හා අණපනත් ගෙන ඒම, කුඩා ප්‍රමාණයකින් වැඩි අස්වැන්නක් ලබාදෙන රබර් වර්ග හඳුන්වාදීම, රබර් අස්වැන්න රාජ්‍ය මැදිහත් වීමෙන් මිලදී ගැනීම හා සහතික මිලක් ලබාදීම තුළින් වගාකරුවන් දිරිමත් කිරීම, රබර් වගාව තුළ යටි වගාව තුළින් අමතර ආදායමක් ලබා ගැනීමට රබර් වගාකරුවන් දැනුවත් කිරීම, රබර් නිෂ්පාදන සම්බන්ධ දියුණු යන්ත්‍ර සූත්‍ර හඳුන්වාදීම හා ස්වාභාවික රබර් අපනයනය වෙනුවට රබර් නිෂ්පාදන අපනයනය පිළිබඳ දිරිගැන්වීම දැක්විය හැකිය. මෙසේ රබර් නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් ඉහළ විදේශ විනිමයක් රට තුළට ගෙන්වා ගැනීමට කටයුතු කළ හැකිය. මේ අනුව නිගමනය කළ හැක්කේ රබර්

---

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
sithara.kulasinghe@yahoo.com

වගාව ජාතික ආර්ථිකයට ඉහළ දායකත්වයක් සපයමින් නොයෙකුත් බාධක හමුවේ මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කරන බෝගයක් ලෙසයි.

**මුඛ්‍ය පද :** *රබර් වගාව, නිෂ්පාදනය, අපනයන, ආර්ථික*